# Living the Lotus

12
2021
VOL. 195




Buddhism in Everyday Life

## Founder's Reflections

## මිනිසුන්ව විශ්වාස කිරීමේ ශක්තිය එක් රැස්වීම

මේ වසරේ මම වඩාත්ම සතුටු වුනේ, 6 වන ලෝක ආගමික නායකයින්ගේ සාමය සඳහා වූ සමුළුවේ ආරම්භ උත්සවයට සහභාගී වීමට හැකිවීමයි.

වතිකානුවේ ලෝක රදගුරු සම්මන්ත්‍රණ ශාලාවේ දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ ඇතුළු ලොව පුරා සිටින ආගමික නායකයින් එක් රැස්වී, ලෝකය නොයෙකුත් දුෂ්කරතාවයන්ට මුහුණුදෙමින් පවතින බව සාකච්ඡා කරන දර්ශනය දැක, ලැබූ සතුටෙන් මුළු ශරීරයම වෙවුලාගියා.

රංග කලාව, සටන් කලාව හෝ ක්‍රීඩාව වේවා ඕනෑම විෂයපතයක් ගැඹුරටම ඉගෙන ගැනීම තුලින්, මනුෂ්‍යයන් ගැනද හොඳින් විමර්ෂණය කිරීමට හැකිව ඔවුන්ගේ හරය ග්‍රහණය කරගැනීමට හැකිවි, සෑම දෙයකටම හේතුවන යථාර්ථයද හොඳින් අවබෝධ කරගැනීමට හැකිවේ. එවිට තමාතුල තිබෙන මුරණ්ඩුගති පහවගොස්, ඕනෑම පුද්ගලයෙකුව භාරගැනීමට හැකිව, උපේක්ෂාවෙන් යුතුව ජීවත්විමට හැකිවේ.

ධර්ම මාර්ගයද එසේමය. තමා විශ්වාස කරන ධර්මය හොඳින් විමර්ශනය කර එහි හරය අවබෝධ කරගත්විට, හදවත්ලෙන්ම අන්‍යයන්ව විශ්වාස කරමින්, ඕනෑම පුද්ගලයෙකු සමග සහයෝගයෙන් කටයුතු කිරීමට හැකිවේ. එසේ විශාල පිරිසකගේ බලය එක් රැස්වීම 21 වන ශතවර්ෂයට අත්‍යාවශ්‍ය කරුණක් වනවසේම, ඒ තුලින් යුධමය තත්වයන් නොමැති සාමකාමී ලෝකයක් ගොඩනගා ගැනීමට හැකිවේ. ඒ වෙනුවෙන් අපි උපරිම උත්සහයෙන් කටයුතු කරමු.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 104-105

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැඳගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 195 (December 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala,
Ruklanthi Palipana, Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international
@kosei-kai.or.jp

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු-එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



# හදවතේ හඬට හොඳින් සවන් දෙන්න

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## පසු විපරම් කිරීම, සත්‍යාවබෝධය ලබාගැනීමට සමාන වේ

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ අවසාන සූත්‍රය ලෙසින් හඳුන්වන, සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම පිළිබඳ සූත්‍රය තුල 'පසු විපරම ප්‍රගුණ කරන මිනිසුන්, ගලා බැසයන ජල ධාරාවක් සේ කිසිවක නොඇළුනු කාය චිත්ත පවිත්‍රත්වයෙන් යුතු වේ' ලෙසින් වැකියක් ඇත. එනම් ඕනෑම මොහොතක වැරදි පිළිගැනීම හා පසු විපරම් කිරීම අමතක නොකරන්නේ නම්, ගලා බැසයන ජල ධාරාවක් සේ නිදහසේ ප්‍රබෝධමත්ව ජීවිතයක් ගත කිරීමට හැකිවනවා වේ. එසේම, එම පසු විපරම් කිරීමේ අවසානය වන්නේ 'සෑම සියළු දෙයකම යථාස්වභාවය ගැඹුරින් අවබෝධ කර ගැනීමය' ලෙසින්ද සඳහන් වේ. එනම් මායාවෙන් හා ඇලීමෙන් ඈත්ව, සෑම විටම යථාර්තය දැකිය යුතුබවයි. නමුත් එම කරුණ, වැරදි පිලිගැනීමට හා පසු විපරම් කිරීමට සම්බන්ධ වන ආකාරය ටිකක් අපැහැදිලි යැයි සිතමි.

මෙහිදී, මම බෑගයේ දමාගෙන නිතරම බලමින් සිටින, නොයෙකුත් වර්ෂයන් ගැන විස්තර සඳහන් කාල දර්ශකය ගැන සඳහන් කරන්නම්,

එය, මේ විශ්වය හා පෘතුවිය ගැන වගේම, ජීවීන් ගැන හා මිනිසුන්ගේ බිහිවීමේ ආරම්භය මෙන්ම එහි ඉතිහාසය ගැනද සඳහන් වන කාල දර්ශකයකි. ඒ තුල 'වර්තමානයේ මා සිටින තැන හා අනාගතය' යන මාතෘකාව යටතේ මෙසේ සඳහන් වී ඇත.

'විශ්වය විසින් බිහිකල විශාල තරු ප්‍රමාණයක් අතරින් මෙම පෘතුවිය බිහිවී, එම පෘතුවිය මත ඇතිවූ මුහුදින් නොයෙකුත් ජීවීන් බිහිවිය. එම විවිධ ජීවීන්ගේ පරිණාමය වීම හේතුවෙන් මිනිසා බිහිවූ බව නවීන විද්‍යාව තුලින්ද සාක්ෂාත් කරඇත. එසේ ගත්කල මේ විශ්වයේ, පෘතුවියේ හා ජීවීන්ගේ ඉතිහාසය අපි තුල ගැබ්වී තිබේ.'

මට එම කාල දර්ශකය බලන වාරයක් පාසා, 'අපි මේ ආකාරයට, මෙතැන සිටිනවා' ලෙසින් මනුෂ්‍යයන්ගේ පැවැත්ම හා ජීවයේ පුදුම සහගත බව දැනෙනවා. ඒ සමගම, සෑම සියළු දෙයක්ම ගණනය කල නොහැකි කාලපරාසයක් ගත කරමින්, ඉමහත් වූ 'ජීවයක්' ගොඩනැගීමට මෙම ඉතිහාසය දයක වුවා යැයි සිතෙනවා. විටෙක මානසික වෙහෙස දැනෙන විට, 'ආ... මම මේ ලෝක ඉතිහාසයේ එක් පුද්ගලයෙකු' යනුවෙන් සිතමින් මගේ දැක්ම පුළුල් කර ගැනීමට හැකිවීමෙන් ඉතා සැහැල්ලුවක් දැනෙනවා.

එදිනෙදා ජීවිතයේ මිනිසුන් හා නොයෙකුත් සංසිද්ධි තුල වෙනස්කම් තිබුනද, පරම සත්‍යය වන්නේ අපි හැමෝම කිසිම වෙනසක් නොමැති සාමානාත්මතාවයෙන් පිරි ලෝකයක සිටින බවයි. එම යථාර්තය අවබෝධ කර ගනිමින් තමා ගැන නිරන්තරයෙන් පසු විපරම් කරන්නේ නම්, ශරිරයත් මනසත් පිරිසිදු වීම තුලින් සත්‍යාවබෝධ ලබා ගැනීමට හැකි වෙනවා.

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ හා කෝසෙයි කායිහි නියම හරය

මම මේ දක්වා වැරදි පිලිගැනීම හා පසු විපරම් කිරීම ගැන එකට කතාකලා. නමුත් ඒ අතර ආගමික වශයෙන් කරනා පසු විපරම් කිරිම හා සාමාන්‍යයෙන් කරන වැරදි පිලිගැනිම අතර වෙනස් අරුතක් ඇතිබවයි සමහර පුද්ගලයන් සිතන්නේ. අනිවාර්යයෙන්ම ආගමික වශයෙන් කරන්නාවූ පසු විපරම ආධ්‍යාත්මික දියුණුව සඳහා කරන්නාවූ ආත්ම පරිත්‍යාගය හා ඉවසීම අඩංගු වන නිසා ප්‍රබල විය හැකිය. එසේම සාමාන්‍යයෙන් කරන්නාවූ වැරදි පිලි ගැනිම වඩා ඉහල තත්වයකට යාම සඳහා සිදුකරන්නක් යැයි සිතමි. ඒ අනුව වැරදි පිලිගැනීමේත්, පසු විපරම් කිරීමේත් පදනම එකක් යැයි මම සලකමි.

කෙසේ වෙතත්, ආගමික වශයෙන් කරන පසු විපරම් කිරීම, තම ඇතුලාන්තයේ සිටින බුදුන්ට ආමන්ත්‍රණය කිරීමක් ලෙස සඳහන් කිරීමටද හැකිය. සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම පිළිබඳ සූත්‍රය තුල 'ඔබ බුදුරදුන් ප්‍රත්‍යාවේක්ෂණය කල යුතුය' ලෙසින් පසු විපරම් කිරීම පිළිබඳ වැකියක, අප තුල කෝපය හා තෘෂ්ණාව ඇතිවූ විට 'තමා තුල සිටින බුදුන්ව සොයාගෙන, තමාගේ යථාස්වරූපයට නැවත යන්න' ලෙස පවසමින්, අපගේ ඇතුලාන්තයේ සිටින බුදුන්ට සවන්දීමට කියාදෙයි. තවත් විටෙක, විශාල වපසරියක් ඇති විශ්වය පුරා සැරිසරා, මේ පෘතුවිය හා ජීවයේ ඉතිහාසය ගැන සිතන්නත්, ඒතුල මිනිසාගේ හා තමන්ගේ පැවැත්ම තුලින් අදහස් කරන්නේ කුමක්දැයි සිත සමාධිගත කරගෙන කල්පනා කරන්නත් උනන්දු කරවයි. ඒ ආකාරයට තමා තුල සිටින බුදුන් දෙසට හැරී, ඒ හඬට සවන් දෙන්නේ නම්, වඩා හොඳ ජීවිතයක් ගත කිරීමට හදවත පිලියෙල කරගැනීමට හැකිවනු ඇත. ඉන්පසු ඉතිරිව තිබෙන්නේ ප්‍රයෝගිකව පුහුණුවේ යෙදී කටයුතු කිරීම පමණී.

සුප්‍රසිද්ධ නිචිරෙන් ෂෝනින් තුමා විසින් 'ධර්මයේ හරය අඩංගු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය වැදගත් වනවා සේම, ඒ තුල ඇති අගර්හීත බෝධිසත්වයන් වහන්සේගේ පරිච්ඡේදය ප්‍රයෝගික පුහුණුව සඳහා වැදගත් වේ' ලෙසින් පවසා තිබෙයි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය වන්දනා ග්‍රන්ථය ලෙස සලකන අප සංවිධානයේ, දෑත් එක්කර සෑම දෙනාටම ගෞරව වන්දනා කරන ස්වරූපය සේ නිර්මාතෘ තුමා සැලකුවේ අගර්හීත බෝධිසත්වයන් වහන්සේවය. මන්ද එම ස්වරූපය තුලින් පසු විපරම් කිරීම යන සත්‍යාවබෝධය ස්වරූපය පෙන්වන අතරම, අපට වඩාත්ම සමීපතම ප්‍රායෝගික පුහුණුවද එය වේ.

නිර්මාතෘ තුමා ජීවත්ව සිටින අවදියේ ගරුකල කල දෑත් එක්කර වන්දනා ස්වරූපයෙන් සිටින බුද්ධ ප්‍රතිමාව, අදත් අපේ නිවසේ වැඩ වසමින් විශාල පිරිසකගේ සතුට ප්‍රාර්ථනා කරයි.

From *Kosei*, December 2021.

# මවට ස්තුතිවන්ත වීම සහ මාගේ ජීවිතය

බ්‍රසීල ධර්ම ශාඛාවේ ශාඛා පරිපාලක
ෂිදයි කෝඉචි මහතා

මෙම සෙප්පෝව, 2021 වසරේ අගෝස්තු මස 22 වන දින බ්‍රසීල ශාඛාවේදී පැවැත්වූ බ්‍රසීල ශාඛාවට 50 වසරක් සපිරීම නිමිත්තෙන් පැවැත්වූ උත්සවයේදී ඉදිරිපත් කල සෙප්පෝවේ සංස්කරණයකි.

බුදුන් වහන්සේගෙන් සහ නික්යෝ නිවානෝ තුමාගෙන් අවසරයි. සියළු දෙනාගෙන්ම අවසරයි. මම ෂිදයි කෝඉචි. මම පවුලේ වැඩිමහල් පුතායි. යුජිරෝ සහ බින්සුඕ මගේ බාල සහෝදරයන් වේ. තවද කුඩම්මා වන මරුද සාන්ගේ දරුවන් වන වැඩිමහල් සහෝදරයෙකු සහ බාල සහෝදරියක් සිටිනවා. අපේ පවුල ජපන් බ්‍රසීල ජාතිකයන්. මගේ මවගේ දෙමව්පියන්, 1962 වසරේ ජපානයේ ෆුකුයි ප්‍රාන්තයේ සිට බ්‍රසීලයේ සන්පොල් ප්‍රදේශයේ පිහිටි සන් මිගෙල් ප්‍රදේශයට පදිංචියට පැමිණියා. තාත්තාගේ උපන් ගම වුයේ නීගතා ප්‍රාන්තයයි. මගේ දෙමව්පියන් සන්පෝල් ප්‍රදේශයේදී හමුවී 1976 වසරේදී විවාහා වී, ටික කලකින් මම මේ ලෝකයට ඉපදුනා.

මම කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වන්නේ අපේ පවුලේ 3 වන පරම්පරාවේ පුරුකක් ලෙසයි. මම කුඩා කාලයේදී බ්‍රසීල ධර්ම ශාඛාව තුල ගත කල ආකාරය සාමාජිකයන්ගේ හැසිරීම් රටාව දැනුත් මට මතකයට නැගෙනවා. දකෙඋචි කිමියෙ කියෝකයිචෝ සාන්, ලස්සන හසෙගවා අකිකො ශිබුචෝ සාන්, කරුණාවන්ත මත්සුමුරා ඉකුයො සාන්, ස්ථාවරව කටයුතු කරන සතෝ ඉකුයො සාන්, නිහතමානී ඔනො මිත්සුළු සාන්, කරුණාවන්ත අබෙකෝසෝ සාන්, එසතෝ සාන් යන මහත්ම මහත්මීන්, සහ විවිධ පුද්ගලයන් රාශියක් සිටි සාමකාමී ධර්ම ශාඛාවක් වුනා.

කෙසේ වෙතත්, ටික කලකට පසු මවගේ රෝගාබාධයක් නිසා, වසර 10 ක් පමණ ධර්ම ශාඛාවට යාමට නොහැකිව ශාඛාවෙන් ඈත්වී කටයුතු කලා. අම්මාගේ රෝගය නිසා. අපි ඉතා දුෂ්කර ජීවිතයක් ගත කලා. විශේෂයෙන්ම, මවගේ අසනීපය නිසා තාත්තා ලොකු පීඩනයකින් දුකකින් සිටියා. එම කාලයේ, ධර්ම ශාඛාවේ සාමාජිකයන් තාත්තාව කරුණාවෙන් සහ ආදරයෙන් පිළිඅරගෙන තාත්තාගේ හිතට සහනයක් ගෙන දීමට කටයුතු කලා.

අම්මාගේ ඉල්ලීම පරිදි දෙමව්පියන් දික්කසාද වුනා. තාත්තා අම්මා සමඟ සාමකාමීව ජීවත් වීමට තැත් කලත්, එය සඵල කර ගැනීමට නොහැකිවුනා. ඉන් පසු තාත්තා ප්‍රානා ප්‍රදේශය උපන් ගම වන මරුද සාන් සමඟ විවාහා වී, මේ වසරේදී 23 වන විවාහා සංවත්සරය සමරනවා. තාත්තාගේ රැකියාවට අමතරව ඔවුන් දෙදෙනා විශාල පිරිසකගේද උදව් උපකාර ඇතිව ළමයින්ට නොමිලේ ප්‍රතිකාර කරන වැඩසටහනක් පවත්වාගෙන ගියා. ගිය වසරේදී පියා රැකියාවෙන් විශ්‍රාම ගොස් සිටින නිසා, දැන් දරුවන් දෙදෙනා ඔවුන්ව බලාගනිමින් කටයුතු කරමින් සිටිනවා.

අනෙක් අතට මවගේ අසනීපය එන්න එන්නම නරක අතට හැරුනා. මරුද සානුත් අම්මා ගැන කනස්සල්ලෙන් කටයුතු කලත්, මව ව මනෝචිකිස්සක සායනයට ඇතුලත් කරමින්, කටයුතු කල පසු සන් බර්නාඩෝ කැම්සෝ ප්‍රදේශයේ තිබෙන විල මත මරණයට පත් වුනා. එය සිදුවුනේ 1998 වසරේදීයි.

අම්මා ගැන මගේ හිතේ තිබුන සංකීර්ණ හැඟීම, ආදරයෙන් අපිව රැක බලා ගත්තාට ස්තුතිවන්ත බව, රෝගයෙන් පෙලුනු අම්මව රැකබලාගැනීමට නොහැකි වූ දුක, තරුණ වියේදීම මවගේ මරණය ගැන කණගාටුව, එසේම අම්මා අපිට ඉතුරු කර ගිය ප්‍රශ්ණ පිළිබඳ වෛරය මගේ සිත තුල තිබුනා.

කුඩා කාලයේ, මව අපි පිළිබඳ දැඩි ආශාවකින්, ළමුන් දෙමව්පියන්ගේ දේපලක් යැයි තදින් විශ්වාස කලා. අම්මා රෝගාතුර ව සිටි කාලයේ, මුළු ලෝකයම අපිට සතුරුකම් කරනාවා යැයි සිතමින් අපිව සමාජයෙන් ආරක්ෂා කිරීමට යැයි සිතා අපිව නිවස තුලටම සිරකර තැබුවා. එය කෝසෙයිකායි සාමාජිකයන්ටත් අසල්වාසීන්ටත් පීඩාවක් වුනා. ඉන් පසු 'Beautiful mind' යන ඇමරිකානු චිත්‍රපටය බැලීමෙන් පසුව අම්මාව පීඩනයට පත් කල රෝගය භින්නෝන්මාදය යන රෝගය බව මම වටහා ගත්තා.



බ්‍රසීල ධර්ම ශාඛාවේදී සෙප්පෝව ඉදිරිපත් කරන ෂිදයි සාන්.

මවගේ මරණයෙන් පසුව, මට නරක හීන පෙනෙන්නට පටන්ගෙන මම මහත් පීඩාවට පත්ව සිටියා. උදෑසන නින්දෙන් නැගිටින විට හයවී දඩිය වගුරවමින් මම ඇඬුවා. ටිකෙන් ටික සූත්‍ර සජ්ජායනය කිරීම ජීවිතයට බද්ධ කර ගත්විට, පුදුම සහගත ලෙස නරක හීන පෙනීම අඩු වුනා. මගේ මල්ලී වන යූජිරෝ සහ මිත්සුඹ කෝසෙයිකායි සංවිධානට සම්බන්දවී හොඳින් ධර්මය පුහුණු කල නිසා බුදු පිළිම වහන්සේ ලබා ගැනීමට හැකි වී, සූත්‍ර සජ්ජායනය එදිනෙද ජීවිතයේ කොටසක් බවට පත් වුනා. බුදු පිළිම වහන්සේ නිවසේ තැන්පත් කිරීමෙන් පසු බුදු කුටිය මහත් ශුද්ධ වූ ස්ථානයක් බවට පත් වී, සූත්‍ර සජ්ජායනයට මහත් කැමැත්තක් ඇතිවුනා.

එසේම, අම්මා සිහිපත් කර සූත්‍ර සජ්ජායනයක්ද පැවැත්වූවා. පුදුම සහගත ලෙස සූත්‍ර සජ්ජායනය තුලින්, අම්මා ගැන තිබූ වෛරය නැතිවී, ඇයට ස්තූතිවන්ත වීමට හැකි වුනා. මාව මේ ලෝකයට බිහිකර, ඇතිදැඩි කරමින් හොඳින් අධ්‍යාපනය ලබා දුන්නට සහෝදරයන් නියෝජනය කරමින් මම අම්මාට හදවතින්ම ස්තූතිවන්ත වනවා. අම්මේ බොහොම ස්තූතියි. දැනුත් මට සිහිනෙන් අම්මාව පෙනෙනවා වුනත්, දැන් පෙනෙන හීනනම් නරක සිහින නොවේ, අම්මා සමග සුහඳව කහාබහ කරන සිහිනයි.

අපි දෙවන පරම්පරාවේ මොරිකෙයියුචි කියොකයිචෝ සාන්ගේ කාලයේ නැවතත් ධර්ම ශාඛාවට යාමට පටන් ගත්තා. ඒ කාලයේ මම මත්සුමුරා මිත්සු ගුකිබුරෝ සාන් සමග ධර්ම ශාඛාවේ ශබ්ද පරිපාලන කටයුතු සිදු කලා. මත්සුමුරා සාන් සමග රාජකාරි කරන අතරතුර, සූත්‍ර සජ්ජායනයට හොඳින් ඇහුන්කන්දීම, නියමිත වෙලාවට ශබ්ද පාලනයේ වැදගත්කම ඉගෙනගත්තා.

වර්තමානයේ තිබෙන බ්‍රශීල ශාඛාව නිර්මාණය කලේ, දැන් ශාඛාවේ උපදේශක තනතුරේ සිටින මොරි කියොකයිචෝ සාන් තුමයි. කලින් ධර්ම ශාඛාවේ නොතිබූ තයිකෝ වාදනය කිරීමේ වගකීම මට පැවරුනා. එසේම 2002 වසරේ ජපාන මූලස්ථානයේ පැවති 'ගෝලීය තරුණ එකමුතුව' යන වැඩසටහනටද මම සහභාගි වුනා. මොරි උපදේශක තුමාට මම හදවතින්ම ස්තූතිවන්ත වනවා.

තුන්වන පරම්පරාවේ නගෂිමා තකයුකි කියොකයිචෝ සාන්ගේ ක්‍රියාකාරී ගති ලක්ෂණ නිසා බ්‍රශීල ජාතිකයන්ගේ ආදරය දිනා ගත්තා. එම කාලයේදී පෘතුග්‍රීසි භාශාවෙන් සූත්‍ර සජ්ජායනය සිදු කල නිසා බ්‍රශීල ජාතික සාමාජික සංඛ්‍යාව වැඩි වුනා. එසේම නගෂිමා කියොකයිචෝ සාන් ධර්මය ඉගැන්වීමේ සම්මන්ත්‍රණ ආරම්භ කරමින්, ඔහුගේ අත්දැකීම් තුලින් ශාඛාව මනාව කළමනාකරණය කරමින් පාලනය හොඳින් පවත්වාගෙන ගියා. නගෂිමා කියොකයිචෝ සාන් බ්‍රශීල ශාඛාව නැවත ප්‍රතිස්ථාපනය කලා යැයි මම සිතනවා.

2012 වසරේ නගෂිමා කියොකයිචෝ සාන්ගෙන් පසු නකහරා කත්සුයොෂි කියොකයිචෝ සාන්ගේ පත් වීම මගේ ජීවිතය විශාල වෙනස්කම් දෙකක් සිදුවුනා. පලමු වෙනස ධර්ම ශාඛාවේ පරිපාලන (සෝමුබුචෝ) තනතුර ලැබීමයි. නකහරා කියොකයිචෝ සාන් 'ඔබ ශාඛාවේ පරිපාළන රාජකාරිය භාරගන්න' යැයි මට පැවසූ විට මම මහත් පුදුමයට පත් වුනා. ඒ වගේම මම සෑම දිනකම ශාඛාවට යන්නේ කොහොමද? යැයි කල්පනා කරමින් මට හරි ආකාරව තීරණයක් ගැනීමට සති දෙකක් ගත වුනා. ධර්ම ශාඛා පරිපාලන කියන්නේ ලොකු වගකීමක් නිසා, ඉදිරිය ගැන කල්පනා නොකර සිතට එන දේ ඒ ආකාරයෙන්ම පවසන මගේ නොමේරූ ගති ලක්ෂණ ගැන මම කනස්සල්ලට පත්වුනා. නමුත් මට මේ ලැබෙන රාජකාරිය මනුෂ්‍යයෙකු ලෙස මට හොඳින් වර්ධනය වීමට හොදම අවස්ථාව යැයි සිතා, සිතේ තැතිගැන්මක් තිබුනත් මම රාජකාරිය භාර ගත්තා.

මගේ ජීවිතයේ දෙවන වෙනස්වීම නම්, මූලස්තානයේ අන්තර්ජාතික කාර්යමණ්ඩලයේ රැකියාව ලැබීමයි. මූලස්ථානයෙන් වැටුප් ලැබීම නිසා මම වසර 20ක් සේවය කල රැකියාවෙන් විශ්‍රාම ගැනීම යන තීරනය ගැනීම මට ලෙහෙසි පහසු දෙයක් වුනේ නැහැ. නමුත් බුදු දහමේ තිබෙන ආකාරයට 'අපි සෑම කෙනෙකුම මෙලොවදී ඉටු කිරීමට යම් රාජකාරියක් අතැතිව ඉපදී ඇති බවයි' මම ඒ ආකාරයට කල්පනා කර තීරණය ගත්තා.

කලින් රැකියාවෙන් විශ්‍රාම ගියත්, ආයතන ප්‍රධානී වන ගුන්ජි අකිරා සාන් සහ ඔහුගේ පවුලේ අය සමග මිත්‍රත්වය ඒ ආකාරයටම තිබෙනවා. 2021 වසරේ ජනවාරි මස අන්තර්ජාතික කාර්‍යමණ්ඩලයේ සේවකයෙකු ලෙස බුදුන් වහන්සේගේත්, නික්යෝ නිවානෝතුමාගේත්, නිචිකෝ නිවානෝතුමාගේත්, ආශිර්වාදයෙන් සාමාජිකයන් වෙනුවෙන් ඇප කැප වී වැඩකටයුතු කරනවා.

අන්තර්ජාතික කාර්යමණ්ඩලයේ සේවකයෙකු ලෙස කටයුතු කිරීම තුලින්, මිනිසුන් සමග කටයුතු කලයුතු ආකාරය ඉගෙන ගත්තා. කලින් රැකියා ස්තානයේ මට පැවරී තිබුනේ විදුලි උපකරණ ප්‍රමාණයන් සටහන් කිරීම, මිල ගානණය කිරීම, අමුද්‍රව්‍ය වල පිරිවැය සකස් කිරීම නිසා මිනිසුන් සමග ගැටී කටයුතු කරීමට අවස්ථාවක් ලැබුනේ නැහැ. මම තනිව ජීවත් වීමට කැමති පුද්ගලයෙක් වුනත්, ධර්ම ශාඛාවේදී මට සුවපහසු පරිසරයෙන් මිදී, සාමාජිකයන් සමග කතාබහ කිරීමට පෙළඹුනා. විශේෂයෙන්ම ධර්ම ශාඛාවට පළමු වතාවට පැමිණෙන පුද්ගලයෙකු සමග කතාබහ කිරීම මට ලොකු අභියෝගයක් වුනා. සසකි හිරිෂිඋමි කියොකයිචෝ සාන් සමග සාමාජිකයන් කතාබහ කල විට ඔවුන් සතුටින් සිටිනවා. මමත් කියොකයිචෝ සාන් වගේම සාමාජිකයන් සතුටු කල හැකි ආකාරය ඉගෙන ගන්නවා. එමෙන්ම නකහර කියොකයිචෝ සාන්ගෙන් සාමාජිකයන්ගේ බුද්ධ ස්භාවයට ගෞරව කරමින්

ඔවුන්ව තේරුම්ගෙන කටයුතු කිරීමේ වැදගත්කම ඉගෙන ගත්තා. මම මෙතෙක් කල් ජීවිතය ගතකල ආකාරය ටික ටික වෙනස් කර සාමාජිකයන් ගැන අවබෝධයකින් යුතුව ඔවුන්ව වැදගත්කොට සළකමින් කටයුතු කරනවා.

මට සාමාජිකයන් කිහිප දෙනෙකු තෙදොරි කිරීමට අවස්තාව ලැබුනා. එයින් එක් පුද්ගලයෙක් සන්පෝල් ප්‍රදේශයට කිලෝමීටර 2800 දුරින් පිහිටි පැරා ප්‍රදේශයේ බාත් කරීනා නගරයේ ජීවත්වන චියාගෝ බ්‍රාගා සාන්ය. චියාගෝ සාන් ක්‍රියාකාරී සාමාජිකයෙකු සේම ධර්මය පිළිබඳ මනා පැහැදීමකින් සිටින් අයෙක්. එසේම ඔහු අමිගෝ සාමාජිකයෙක් (තමන් අදහන ආගමෙන් ඈත් නොවී, බ්‍රශීල ධර්ම ශාකාවේ වැඩසටහන් වලටද සහභාගිවන සාමාජිකයන් මේ නමින් හඳුන්වයි) ලෙස ශාඛාවට පැමිණ ඉන් පසු සාමාජිකත්වය ලබා ගත්තා. පළමු වතාවට ඔන්ලයින් ඔස්සේ බුදුපිළිම වහන්සේ තැන්පත් කලේ ඔහුගේ නිවසේදියි. චියාගෝ සාන් සහ ඔහුගේ යහළුවෙක් වන පීටර් එන් හික්කෙද සිල්වා ඇල්බුකර්කි සාන් සද්ධර්මපුන්ඩරීක සූත්‍රය ඉගැනගැනීමට ඔන්ලයින් වැඩසටහනකට සහභාගි වී ධර්මය ගැන ගොඩක් දේ ඉගෙන ගත්තා යැයි පැවසුවා.

චියාගෝ සාන්ගේ හඳුන්වාදීමෙන් පාරා රොස්‍රිගස්මයෝ සාන්ද කෝසෙයිකායි සංවිධානයේ ඉගැන්වීම් ගැන සිත පැහැදී ගිය මාසයේ සිට අමිගො සාමාජිකයෙක් බවට පත් වුනා. සාරා සාන් පෙර සිටම වෙනත් බෞද්ධ සංවිධනයකින් බුදු දහම ඉගෙනගෙන සිටි අයෙක්. මේ තිදෙනාත් ඇතුළුව විශාල සාමාජිකයන් ප්‍රමාණයක් සමග කටයුතු කිරීමට මට හැකියාව ලැබුනා.

බුදු දහම ඉගැන්වීමේ සම්මන්ත්‍රණ, වැඩමුළු, සූත්‍ර සජ්ජායනා වැනි මෙතෙක් සිදුකරමින් පැමිණි ක්‍රියාකාරකම් කොරෝනා වසංගත ව්‍යාප්තිය නිසා කරගෙන යාමට නොහැකිව, ධර්මය බෙදා දීමට නව මාර්ගයක් ලෙස ඔන්ලයින් ක්‍රියාකාරකම් ආරම්භ වී තිබෙනවා. මේ ආකාරයට මම කෝසෙයිකායි සංවිධානය තුලින් මිනිසුන් සමග සුහදව කටයතු කරන ආකාරය මැනවින් ඉගෙන ගත්තා. චියාගෝ සාන්ගේ හමුවීම මගේ ජීවිතයට මහත් පිටුවහලක් වුනා. එසේම මෙතෙක් කල් මට හමුවූ සෑම හමුවීමක්ම මට වැදගත් වුනා යැයි සිතනවා.

වසර 20 ක අත්දැකීම් තුලින්, මින් ඉදිරියට වසර 20 කාලයක් කෝසෙයිකායි සංවිධනය වෙනුවෙන් වැඩ කිරීමට දිවුරා පොරොන්දු වනවා.

බුදුන් වහන්සේටත්, නික්යො නිවානෝ තුමාටත්, නිචිකො නිවානෝ තුමාටත්, ඔබ සියළු දෙනාටත් බොහොම ස්තුතියි.

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

### නිර්මාතෘ තුමිය හමුවීම

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ව්‍යාප්ත කිරීම පහසු කරගැනීම සඳහා නිර්මාතෘ තුමා කිරි හලක් විවෘත කරනවා.

කිරි බෙදාහරින මාර්ගයේ අවසානයට නිර්මාතෘ තුමියගේ (මුල් නම - මසා නගනුමා, වෙනස්කරන නම - මියෝකෝ) නිවස පිහිටා තිබුණා. නිර්මාතෘ තුමිය ගිම්හාන කාලයේදී අයිස් සහ ශීත කාලයේදී පුළුස්සන ලද බතල විකුණමින් සිටියා.

නිර්මාතෘ තුමා බෙදාහැරීම් කරන වෙලාවක, අසනීපව හඬමින් සිටින නිර්මාතෘ තුමියට ආදිමුතුන් මිත්තන්ට පිං අනුමෝදන් කිරීමේ වැදගත්කම ඉගැන්වුවා. එම සිදුවීම මුල් කරගෙන නිර්මාතෘ තුමියත් බුදුන් වහන්සේගේ දහම ඉගෙනීම ආරම්භකලා.

පසුව, නිර්මාතෘ තුමාත් නිර්මාතෘ තුමියත් එක්ව රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය පිහිටුවා, විශාල පිරිසකට ඉගැන්වීම් ව්‍යාප්ත කිරීම ආරම්භ කලා.

1




2 3 4 5




ඔබේ දැනුමට

නිර්මාතෘ තුමා අච්චාරු කඩය වසා, කිරි හලක් විවෘත කිරීමට හේතුවනම්, උදේ හවස කිරි බෙදාහැරීම් කටයුතු කර ඉතිරිවන කාලයේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙනීම් කටයුතු හා ව්‍යාප්ත කිරීමේ කටයුතුවල යෙදීමට හැකිවන බව කල්පනා කල නිසාය.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ආරම්භය




රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය, 1938 වසරේ 3 වන මස 5 වන දින ආරම්භ කරන ලදි. ආරම්භයේදී 'දයි නිහොන් රිෂ්ෂෝ කෝසෙයි කායි' ලෙස හැඳින්වූ අතර පසුව, 1960 දී දැන් පවතින ලෙස 'රිෂ්ෂෝ කෝසෙයි කායි' ලෙසට පත්වන ලදි.

ආරම්භයේ සාමාජිකයින් 30 දෙනෙකු විය. නිර්මාතෘ තුමා කිරිහල පවත්වාගෙන ගිය නිවස මූලස්ථානය විය.

නිර්මාතෘ තුමා පාන්දර 4 ට අවදි වී කිරි බෙදාහැරීම් කර, දහවල් කාලයේ සමාජික නිවෙස් වලට ගොස් ධර්මය කියාදුන්නා. නැවත සවස් කාලයේ කිරි බෙදාහැරීම් කටයුතු කර, තෙදොරි කර පැමිණි අය සමග සාකච්චාකරමින් දිනපතා කාලය ගතකලා.




ඔබේ දැනුමට

රිෂ්ෂෝ කෝසෙයි කායි හි 'රිෂ්ෂෝ' යන්නෙහි තේරුම, බුදුන් වහන්සේගේ නිවැරදි ඉගැන්වීම් මූලික කරගනිමු යන්නයි. 'කෝසෙයි' යන්නෙහි තේරුම, බොහෝ පිරිස් සමග කටයුතු කර දිරිමත් කරමින්, පෞර්ෂය වර්ධනය කරගැනීම සඳහා එකිනෙකා සමග කටයුතු කරමු යන්නයි.





# Director’s Column

## පසු විපරම් කිරීමේ සමීපතම ප්‍රයෝගික පුහුණුව

අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා

මේ මාසයේදීත් නිච්කෝ නිවානෝ තුමා විසින් ‘සමන්ත්‍ර භද්‍ර බෝධිසත්වයන් මෙනෙහි කිරීම පිළිබඳ සූත්‍රය’ ගැන කියා දුන්නා. කෘතවේදීත්වයෙන් යුතුව ඒ ගැන කතා කරමු.

එම ධර්ම පණිවුඩයේ මුල් කොටසේදී, නිච්කෝ නිවානෝ තුමා විසින් පසු විපරම් කිරීම පිළිබඳ දැනුම ලබාදුන් අතර, අග කොටසේදී පසු විපරම් කිරීමේ ප්‍රයෝගික පුහුණුව ලෙසින් අපට සමීප අගර්හීත බෝධිසත්වයන් වහන්සේ ගැන සඳහන් කරමින්, ගෞරව වන්දනා කරන බෝධිසත්වයන්ගේ ප්‍රයෝගික පුහුණුවේ යෙදීමට ධෛර්යය ලබාදෙයි.

එසේම පසු විපරම් කිරීම යනු, ‘සෑම සියළු දෙයකම යථාස්වභාවය ගැඹුරින් අවබෝධ කර ගැනීමයි’ සේ සඳහන් කරමින්, මායාවෙන් හා ඇලීමෙන් ඈත්ව ‘යථාර්තය’ දැකීමට කියාදෙයි. එසේ නියම ‘යථාර්තය’ දැකීම ප්‍රයෝගිකව සිදුකිරීම සාමාන්‍ය මිනිසුන් වන අපට මුවින් පවසන තරම් පහසු කාරයයක් නොවේ යැයි සිතමි.

මෙහිදී නිච්කෝ නිවානෝ තුමා විසින් නිතරම ළඟ තබාගෙන සිටින කාල දර්ශකයක් ගැන් සඳහන් කලා. මේ විශ්වයේ බිහිවීම, පෘතුවිය හා මිනිසුන්ගේ බිහිවීම යන විශ්මය ජනක ඉතිහාසය දෙස බලන විට, තමා සිටින්නේ කොතැනදැයි අවබෝධ කරගැනීම තුලින් සිත සැහැල්ලුවට පත්ව, හදවතත් මනසත් පිරිසිදු කරගන්නා ආකාරයේ තම අත්දැකීම්ද බෙදා දුන්නා.

එසේනම්, ‘ඔබ තුල වැඩ සිටින බුදුන් වහන්සේ’ කුමක් පවසනවා ඇතිද? ගෞරව වන්දනා කිරීම තුලින්, තමාගේ ‘හදවතේ හඬට’ සන්සුන්ව සවන්දී බලන්න.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809, Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**